*දේපළට පිවිසීම.-* හිඟුරක්ගොඩ නගරයේ සිට හතමුන පාරේ කිලෝමීටර් 3ක් පැමිණි විට මෙම දේපළ එම පාරේ වම් පසට වන්නට පාරට මුහුණ ලා ඇත.

*ගෙවීමේ කළ යුතු ආකාරය. -* විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),

(02) ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුලත නැෂනල් ඩිවෙලොප්මන්ට බැන්ක් පී. එල්. සී. හි තැන්පත් කළ යුතු ය .

(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),

(04) පළාත් පාලන අය බදු සියයට එකයි (1%),

(05) ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,

(06) ලිපිකරු හා සෝෂක වේතනය රු. 2,500,

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID - 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් විමසන්න.

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ උසාවි කොමසාරිස්වරු.

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය,
බලයලත් වෙන්දේසිකරු රාජ්‍ය සහ වාණිජ බැංකු,
අංක 200, 2 වන මහළ, හල්ස්ඩ්‍රෝෆ් වීදිය, කොළඹ 12 ,
දුරකතන අංක : 011 23965520.

කළමණාකරු මධ්‍යගත (අයකිරීම් අංශය),
නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී,
අංක 40, නවම් මාවත, කොළඹ 02
දුරකථන අංක 011- 2448448.

12-428

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - දඹුල්ල ශාඛාව (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දවූ ද, කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හේවාපතිරණ විසින් සියල්ල ලියා සහතික කරන ලද අංක 4020 හා 2015.03.18 දින දරන, අංක 4120 හා 2015.06.30 දින දරන අංක 4475 හා 2016.04.29 දින දරන අංක 4786 හා 2017.01.26 දින දරන, අංක 5114 හා 2017.11.29 දින දරන සහ අංක 5502 හා 2019.02.27 දින දරන උකස් බැඳුම්කර යටතේ අය විය යුතු මුදල් ගෙවීම මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳ දමා ඇති ආර්. එස්. ඉම්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හෙවත් ආර්. එස්. ඉම්පෝට්ස් (පීවීටී) එල්ටීඩී විසින් ණයකරු වශයෙන් සහ රොහාන් රණසිංහ යන අය උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියළු ස්ථාපිත ගෙවීම් සහ වෙන්දේසිකරුගේ ගාස්තුව ඇතුළු සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ එම දේපළ පිහිටි ස්ථානයේදී **2023 ක් වූ ජනවාරි මස 20 වැනි දින පෙ. ව. 9.30 ට** මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ, උතුරේ වග පනහ පල්ලේසිය පත්තුවේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ දඹුල්ල මහ නගර සභා සීමාව තුළ දඹුල්ල නගරය ග්‍රාම නිලධාරී වසම තුළ දඹුල්ලේ පාදෙනිය ගමේ පිහිටි ''තලවෙලේයාය කොටස'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එම්. ආරියදාස විසින් සාදන ලද අංක 14039 හා 2014.02.05 දින දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස.

ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහයයි දශම තුනක් (රූ. 1, පර්. 10.3) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේ ද සමග වේ.

යෝජනා සම්මුතිය සඳහා 2022.10.21 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, සහ 2022.11.01 වැනි දින මව්බිම, ඩේලි මිරර් සහ තිනකුරල් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.* - දඹුල්ල නගර මධ්‍යයේ සිට (කුරුණෑගල හංදිය) නුවර පාර ඔස්සේ මීටර් 600 ක පමණ දුරක් ගමන් කළ විට (පොදු බස්නැවතුම්පල සිට මීටර් 100ක් පමණ ඈතින්) විෂයගත දේපළ මෙම පාරේ සහ එය ඉදිරිපිට වම් පැත්තේ පිහිටා ඇත. (C. S. කාර් විකුණුම් පරිශ්‍රයට කිට්ටුව)

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ වහාම උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු යි. චෙක්පත් භාරගනු නොලැබේ :

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකයි (1%),
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහයි (2.5%),
(04) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000,
(05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 2,000,
(06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
(07) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සි. වෙත ගෙවිය යුතු ය. දින 30ක් තුළ දී ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල ආපසු නොගෙවන අතර, දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID - 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

හිමිකම් ඔප්පු හා අදාල ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා :-

ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයිකිරීම්),
හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479,
ටී. බී. ජයා මාවත,
කොළඹ 10.
දුරකතන අංක 011 - 2661828, 011-2661866

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල උසාවි පාර,
කොළඹ 12.
දුරකතන අංකය : 011- 2396520
ඊමේල් : senaservice84@gmail.com

12-417

---

**පෑන් ඒෂියා බෑංකින් කෝපරේෂන් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පෑන් ඒෂියා බෑංකින් කෝපරේෂන් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දක්වෙන දේපළ දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, (දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කොට්ඨාසයේ) කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභාවේ, සහ මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පමුණුව, අංක 528 ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ පමුණුව, වරිපනම් අංක 19A, නව රෝහල පාර, පිහිටි ''උස්වත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඩී. එදිරිවික්‍රම විසින් මැන සාදන ලද වර්ෂ 2006.10.25 දිනැති අංක 2369 දරන පිඹුරෙහි (බලයලත් මිනින්දෝරු එස්. ඩබ්ලිව්. මාකලන්ද විසින් මැන සාදන ලද 1975.03.02 දිනැති අංක 1173 දරන පිඹුරේ දක්වෙන ඉඩම නැවත මැනීමක් වන) දක්වෙන ''ලොට් A'' දරන ඉඩම සහ එහි පිහිටි සියලු දෙය වේ.

විශාලත්වය : (පර්. 12)
**වර්ෂ 2023 ක්වූ ජනවාරි මස 17 වැනි දින පෙ. ව. 9.30 ට**

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. සූරියආරච්චි විසින් සහතික කරන ලද වර්ෂ 2018.11.09 වැනි දිනැති අංක 1280 දරන ප්‍රාථමික උකස්කරය සහ වර්ෂ 2020.03.17 වැනි දිනැති අංක 1545 දරන ද්විතීයික උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම සිදුකිරීම නාරාහේන්පිටගේ සංජීව ප්‍රේමලාල් පෙරේ යන අය ''බන්ධනදායි/ උකස්කරු'' ලෙස ද පැහැර හැර ඇති හෙයින් ද,

*යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා* .- වර්ෂ 2022.09.23 වැනි දිනැති රජයේ ගැසට් පත්‍රය, දිවයින, දි අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත් පත් ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - මහරගම බස් නැවතුම්පළේ සිට පරණ මහරගම පාරේ පරණ මහරගම පාර දිගේ කොට්ටාව දෙසට මීටර් 200 ක් පමණ ගොස් පමුණුව පාරට වමට හැරී කිලෝමීටර් 1.9ක් පමණ ගමන් කර දකුණට හැරී මිහිඳු මාවතට පැමිණ මීටර් 60ක් පමණ ගිය විට විෂයගත දේපළ වෙත ළඟා විය හැකිය. එය පිහිටා ඇත්තේ මෙම මාර්ග රක්ෂිතයේ වංගුවෙහි දකුණු පසින් සහ එහි බටහිර මායිමේ මෙම මාර්ගයට මුහුණලා ය. දේපල වෙත යන මාර්ග මෝටර් රථ පොදු මාර්ග වේ.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය .

(1) ගැණුම් මුදලේ 10 % ද (සියයට දහයක්),
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% (සියයට එකයි) සහ වැට් බද්ද ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්)
(4) ප්‍රචාරක වියදම් හා අනෙකුත් ගාස්තු ද,
(5) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු රු. 5,000 ක් ද,
(6) ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 2,500 සහ වෙන්දේසිය සඳහා වියදම් වූ අනෙකුත් ගාස්තු ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාල තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු - නීති, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී., ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-4667227/011-4667130.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන : 011- 2873656, 0777-672082,
ෆැක්ස් අංකය : 011- 2871184.

12-438

---

## පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියේ විකිණීමයි

පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දක්වෙන දේපළ වර්ෂ **2023ක් වූ ජනවාරි මස 10 වැනි දින පෙ. ව. 10.00** ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, හොරණ නගර සභා සීමාවේ, හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හල්තැටියවත්ත, අංක 615 බී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හොරණ ග්‍රාමයේ ශ්‍රී සීලරතන පාර වරිපනම් අංක 52 සහ 54 දරන දේපල වන හේගල්ලකන්ද කට්ටිය ලොට් B නමැති ඉඩම මැන බලයලත් මිනින්දෝරු සේනක විතාරණගේ විසින් සම්පාදිත 2013.06.20 දිනැති අංක 5468 දරන පිඹුරේ දක්වෙන ලොට් P දරන ඉඩම (හොරණ දිසා අධිකරණ නඩු අංක 1783 පී නමැති නඩුවට ගොනු කර ඇති බලයලත් මිනින්දෝරු ඩී. එච්. ඇතුලත්මුදලි විසින් සම්පාදිත 1986.09.08 දිනැති අංක 1743 දරන බෙදුම් පිඹුරේ දක්වෙන හේගල්ලකන්ද කට්ටිය ලොට් B නමැති ඉඩමෙහි ලොට් 3 සහ 4 දරන ඉඩම් ඒකාබද්ධ කිරීමක් වන) නමැති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි වැව්ලි සහ අනිකුත් සියලු දෙය වේ.

විශාලත්වය : රූ. 01, පර්. 11.50

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩී. ජේ. එස්. මායාදුන්නේ විසින් සහතික කරන ලද වර්ෂ 2014.09.09 දිනැති අංක 613 දරන ප්‍රාථමික උකස්කරය සහ වර්ෂ 2017.01.11 දිනැති අංක 1254 දරන ද්විතීයික

උකස්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. සූරියාරච්චි විසින් සහතික කරන ලද වර්ෂ 2018.06.14 දිනැති අංක 1178 දරන තෘතීයික උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම ගුලුවිටගේ මනෝජ් ක්‍රිෂාන්ත පීරිස් යන අය බන්ධනදයි /උකස්කරු, වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද,

*යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා.-* වර්ෂ 2022.08.12 වැනි දිනැති රජයේ ගැසට් පත්‍රයද, 2022.07.22 වැනි දිනැති දිවයින, දි අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*දේපලට පිවිසෙන මාර්ගය.* - හොරණ නගරයේ සිට කොළඹ පාර ඔස්සේ කොළඹ දෙසට මීටර් 450ක් පමණ ගොස් සහ වමට හැරී ශ්‍රී සීලරත්න මාවත ඔස්සේ මීටර් 300ක් පමණ ගිය විට එම පාරෙහි දකුණු පසින් විෂයගත දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් වියදම් මුදලින් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් ද, (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5% ක් ද (සියයට දෙකහමාරක්),
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද, (රු. 7,000)

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාල තොරතුරු සඳහා කළමණාකරු ණය අයකර ගැනීම් අංශය, පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී. එල්. සී., ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011- 4667229

තුසිත කරුණාරත්න,
උසාවි කොමසාරිස් තක්සේරුකරු සහ
බලයලත් වෙන්දේසිකරු.

අංක 182/3 (50/3), විහාර මාවත,
කොලොන්නාව.
දුරකථන අංක 011 - 3068185, 071 - 4177199.

12-368

## පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියේ විකිණීමයි

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ **2023ක් වූ ජනවාරි මස 09 වැනි දින පෙ. ව. 10.00 ට** එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ) සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොච්චිකඩේ උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වෝඩ් අංක 09, කොච්චිකඩේ උතුර පිහිටා ඇති මුහුදු මාවත, වරිපනම් අංක 263 සහ 2631/1 දරන ඉඩමට බලයලත් මානක වයි. ඒ. විජේතිලක විසින් මැන සාදන ලද 2011.03.28 දිනැති අංක 2820 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කර වන ලොට් 1 වශයෙන් ලකුණු කර ඇති ඉඩම සහ ඒ මත පිහිටි ගොඩනැගිලි ඇතුළු සැම සියලු දේත් වේ.

බිම් ප්‍රමාණය පර්. 9.69

*දේපළට පිවිසෙන මාර්ගය.-* කොළඹ කොටුව ප්‍රධාන වීදිය (Main Street) පාරේ හෙට්ටිවීදිය හන්දියෙන් වමට හැරී මීටර් 850ක් පමණ හෙට්ටිවීදිය පාරේ ගමන් කළ විට වම් අත පැත්තේ විෂය ගත දේපළ හමුවේ.

තවද, එකී දේපළට මුහුදු වෙරළ පාරේ වරාය ප්‍රධාන දොරටුව සහ කොටහේන හන්දිය අතරින් ද ලඟා විය හැක.

කේ. එම්. කේ. හෝල්ඩිංග්ස් ලිමිටඩ් (කලින් කේ. පී. කාලිඅප්පාපිල්ලෙයි ඇන්ඩ් සන්ස් ලිමිටඩ් යනුවෙන් හඳුන්වනු ලැබූ) ''බන්ධනදායි සහ උකස්කරු'' ලෙසද සහ මර්කන්ටයිල් කෝපරේෂන් ලිමිටඩ් යන අය ''බන්ධනදායි'' ලෙස ද ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ටී. එල්. එම්. ටී. විජේසිංහ විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2014.10.29 දිනැති අංක 190 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය සහ වර්ෂ 2016.06.13 දිනැති අංක 533 දරන ද්විතීයික උකස් බැඳුම්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ආර්. එල්. සී. රණසිංහ විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2017.09.15 දිනැති අංක 1253 දරන තෘතීයික උකස් බැඳුම්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඊ. ඒ. ටී. ඩී. එදිරිසිංහ විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2019.06.14 දිනැති අංක 103 දරන හතරවන උකස් බැඳුම්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

*යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා.-* වර්ෂ 2021.05.06 වැනි දින දි අයිලන්ඩ්, දිවයින, තිනක්කුරල් පුවත්පත් සහ වර්ෂ 2021.05.13 වන දින ගැසට් පත ද බලන්න.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5% (සියයට දෙකහමාරක්),
4. ප්‍රචාරක වියදම්,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,
6. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,500 ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාල තොරතුරු කළමණාකරු - ණය අයකර ගැනීම් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී., ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011- 4667412, 011- 4667237

තුසිත් කරුණාරත්න,
උසාවි කොමසාරිස්,
සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 182/3 (50/3), විහාර මාවත,
කොළොන්නාව.
දුරකථන අංක 011 - 3068185, ෆැක්ස් : 011- 2572940.

12-369

---

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසියයි

පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දක්වෙන දේපළ වර්ෂ **2023 ක් වූ ජනවාරි මස 04 වැනි දින පෙරවරු 10.00 ට** දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවෙහි කඩුවෙල මහ නගර සභා සීමාවේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තලාහේන උතුර අංක 477 ඩී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තලංගම උතුර පිහිටි ගොරකාගහවත්ත හෙවත් දෙල්ගහවත්ත නමැති ඉඩම මැන බලයලත් මිනින්දෝරු ජේ. පී. අයි. අබේකෝන් විසින් සම්පාදිත 1996.12.01 දිනැති අංක 5483 දරන පිඹුරේ දක්වෙන ලොට් 5 නමැති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි වැවිලි ගහකොළ සහ සියලු දෙය වේ. විශාලත්වය පර්. 18.50

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් අයි. බදුගේ විසින් සහතික කරන ලද වර්ෂ 2011.09.30 දිනැති අංක 414 දරන ප්‍රාථමික උකස්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එල්. වඩුතන්ත්‍රි විසින් සහතික කරන ලද වර්ෂ 2013.05.29 දිනැති අංක 85 දරන ද්විතීයික උකස්කරය සහ 2017.05.17 දිනැති අංක 516 දර තෘතීයික උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම සෙඩාර් ක්‍රෙස්ට් යන නාමයෙන් පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයෙහි හවුල් අයිතිකාරිත්වය දරන බාලසූරිය දොන් ටෙරන්ස් ශාන්තරාජා, විදූර ඔදිත බාලසූරිය සහ විනීතා සමරතුංග යන අය බන්ධනදායින් වශයෙන් ද බාලසූරිය දොන් ටෙරන්ස් ශාන්තරාජා යන අය උකස්කරු වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද,

*යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදන සඳහා* .- 2022.07.08 වැනි දිනැති *රජයේ ගැසට් පත්‍රය* ද, 2022.06.27 වැනි දිනැති දිවයින, දි අයිලන්ඩ්, සහ තිනක්කුරල් පුවත් පත් ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.-* පැන් ඒෂියා බැංකුවේ මාලබේ ශාඛාවේ සිට අතුරුගිරිය පාර ඔස්සේ මාලබේ නගරය දෙසට මීටර් 250ක් පමණ ගිය විට මාලබේ ඔරලෝසු කණුව හන්දියට ලඟා විය හැක. ඒ අනුව විෂයගත දේපළ මාලබේ හන්දියේ කඩුවෙල පාර පසෙක පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් වියදම්, මුදලින් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලෙන් 10% ක් ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් ද, (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5% ක් ද (සියයට දෙක හමාරක්),
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද (රු. 7,000)

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක

මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාල තොරතුරු සඳහා කළමණාකරු - ණය අයකර ගැනීම් අංශය, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක 011 4667229

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 011 - 2873656, 0777 672082

12-370

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - පිටකොටුව ශාඛාව (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කොළඹ මහ නගර සභා සීමාව තුළ මට්ටක්කුලිය කොට්ඨාස අංක 01හි මට්ටක්කුලිය ග්‍රාම නිලධාරි වසම තුල මට්ටක්කුලියේ පිහිටි සහ වරිපනම් අංක 393, ෆර්ගියුසන් පාර දරන ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහයක් (රූ. 1, පර්.10) හෝ හෙක්ටෙයාර් 0.1265ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි පස, ගහකොළ, පළතුරු ඇතුළු සෑම සියලු දේ ද සමග වේ.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. සී. ජයවර්ධන විසින් ලියා සහතික කරන ලද අංක 5935 හා 2018.06.13 දින දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කෙන්හෝම් ප්‍රොපටි ඩිවෙලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පැහැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල වලට අනුව, එකී බැඳුම්කර යටතේ අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම මුදල් අයකර ගැනීම සඳහා මෙහි පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන දේපළ වර්ෂ **2023 ජනවාරි මස 11 වැනි දින පෙරවරු 11.30** ට එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කොළඹ මහනගර සභා සීමාව තුළ මට්ටක්කුළිය කොට්ඨාස අංක 01 හි මට්ටක්කුළිය ග්‍රාමනිලධාරි වසම තුළ මට්ටක්කුළියේ පිහිටි සහ වරිපනම් අංක 393, ෆර්ගියුසන් පාර දරන ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් සාදන ලද අංක 1791 හා 2012 ඔක්තෝබර් 10 දින දරන පිඹුරේ ලොට් එක්ස් (බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් සාදන ලද අංක 2955 හා 2005 පෙබරවාරි 27 දින දරන පිඹුරේ ලොට් සී1, සී2, සී3, සී4 සහ සී5 දරන කොටස් ඒකාබද්ධ කර නැවත මැනීමක් වන) වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : වරිපනම් අංක 399, ෆර්ගියුසන් පාර දරන පරිශ්‍රය සහ ෆර්ගියුසන් පාර ද, නැගෙනහිරට : ෆර්ගියුසන් පාර සහ වරිපනම් අංක 391ඒ, ෆර්ගියුසන් පාර දරන පරිශ්‍රය ද, දකුණට : වරිපනම් අංක 391ඒ සහ 305/23, ෆර්ගියුසන් පාර දරන පරිශ්‍ර සහ බස්නාහිරට : වරිපනම් අංක 305/23 සහ 399, ෆර්ගියුසන් පාර දරන පරිශ්‍ර ද මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහයක් (අ.0, රූ.1, පර්.10) හෝ හෙක්ටෙයාර් 0.1265ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි පස, ගහකොළ, පළතුරු ඇතුලු සෑම සියලු දේ ද සමග වේ.

*අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා.-* 2022.10.21 වැනි දින රජයේ *ගැසට් පත්‍රයද*, 2022.11.02 වැනි දින ඩේලි මිරර්, මව්බිම සහ තිනකුරල් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.-* HNB මුතුවැල්ල ශාඛාවේ සිට දකුණු පසින් ෆර්ගියුසන් පාර දිගේ ගමන් කර ෆර්ගියුසන් පාරට මුහුණ ලා දකුණු පස ඇති දේපල වෙත ළඟා වීමට මීටර් 500ක් පමණ ඉදිරියට ගමන් කරන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් පාලන අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක්) විකුණුම් බදු ද, 3. වෙන්දේසිකරුගේ වෘත්තියමය ගාස්තු ද, 4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය ද, 5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව ලෙස රු. 2,000 ක් ද, 6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000 ක් ද වේ.

තවද, ගැණුම් මිලෙන් සියයට අනූවක් (90%)ක් වූ ඉතිරි මුදල විකිණීමේ දින සිට දින (30) තිහක් ඇතුලත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතු වේ. තවද දින (30) තිහක් ඇතුලත ඉතිරිමුදල නොගෙව්වහොත් ගෙවා ඇති සියයට දහය (10%) ක් මුදල අහිමි කිරීමට සහ එකී දේපළ නැවත විකිණීම ට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා වැඩි විස්තර සඳහා. - ජ්‍යෙෂ්ඨ කළමනාකාර - වාණිජ අයකිරීම්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011 - 2661833, 011- 2661836, 011- 2661826.

කේ. පී. එන්. සිල්වා (සා. වි.)
ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු හා උසාවි කොමසාරිස්.

අංක 109/12ඒ, ගෝතමී පාර,
බොරැල්ල, කොළඹ 08
දුරකථන අංක : 011- 4329335, 077 - 8441812.

12-439

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කොඩිකාමම් ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

**1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කොළඹ මහ නගර සභා සීමාව තුළ කොට්ඨාස වැල්ලවත්ත උතුර, අංක 43 හි වැල්ලවත්ත උතුර ග්‍රාම නිලධාරි වසම තුළ ෆ්‍රාන්සස් පාර දිගේ පිහිටි ''කුඩාවැල්ලවත්ත'' නමැති වරිපනම් අංක 8/1, 8/2 සහ 8/3 ෆ්‍රාන්සස් පාර දරන ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් එකොළහයි දශම හයයි අටක් (රූ. 1, පර්. 11.68) හෝ හෙක්ටෙයාර් 0.130713ක් හෝ වර්ග මීටර් 1307.13ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ ඇතුලු සෑම සියලු දේ ද සමග වේ.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් ලියා සහතික කරන ලද අංක 6703 හා 2016.10.25 දින දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කෙන්හෝම් ප්‍රොපටි ඩිවෙලොපරස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පැහැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල වලට අනුව, එකී බැඳුම්කර යටතේ අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම මුදල් අයකර ගැනීම සඳහා මෙහි පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන දේපළ වර්ෂ **2023 ජනවාරි මස 11 වැනි දින පෙරවරු 10.00 ට** එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කොළඹ මහනගර සභා සීමාව තුළ කොට්ඨාස වැල්ලවත්ත උතුර, අංක 43 හි වැල්ලවත්ත උතුර ග්‍රාම නිලධාරි වසම තුළ ෆ්‍රාන්සස් පාර දිගේ පිහිටි "කුඩාවැල්ලවත්ත" නමැති ඉඩමට; වරිපනම් අංක 8/1 සහ 8/2, ෆ්‍රාන්සස් පාර දරන සහ බලයලත් මිනින්දෝරු එස්. සිංගනායගම් විසින් සාදන ලද අංක 1055 හා 1965 ඔක්තෝබර් 20 දින දරන මානක පිඹුරේ ලොට් 17ඒ1/17, ලොට් 17ඒ2/17 සහ ලොට් 17ඒ3/17 දරන කොටස් සහ වරිපනම් අංක 8/3, ෆ්‍රාන්සස් පාර දරන සහ බලයලත් මිනින්දෝරු ආර්. මුරුගුපිල්ලෙයි විසින් සාදන ලද අංක 316 හා 1958 ජනවාරි 05 වැනි දින දරන මානක පිඹුරේ ලොට් 17බී/17 සහ ලොට් 17සී/17 දරන ඉඩම් නැවත මැන ඒකාබද්ධ කොට සාදන ලද ඉඩමට; බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු එස්. ක්‍රිෂ්ණපිල්ලෙයි විසින් සාදන ලද අංක 4062 හා 2016 ජූලි 28 දින දරන පිඹුරේ ලොට් එක්ස් වශයෙන් ලකුණු කර ඇති ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ලොට් 15ඩී ද, නැගෙනහිරට : වරිපනම් අංක 6, ෆ්‍රාන්සස් පාර දරන පරිශ්‍රය ද, දකුණට : ෆ්‍රාන්සස් පාර සහ බස්නාහිරට : වරිපනම් අංක 10, ෆ්‍රාන්සස් පාර දරන පරිශ්‍රය ද මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් එකොළහයි දශම හයයි අටක් (අ.0, රූ.1, පර්. 11.68) හෝ හෙක්ටෙයාර් 0.130713 ක් හෝ වර්ග මීටර් 1307.13ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ ඇතුලු සෑම සියලු දේද සමග වේ.

*අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා.-* 2022.10.21 වැනි දින රජයේ ගැසට් පත්‍රයද, 2022.11.01 වැනි දින ඬේලි මිරර්, මව්බිම සහ තිනකුරල් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.-* වැල්ලවත්ත හන්දියේ සිට ගාලු පාරේ කොළඹ දෙසට මීටර් 200ක් පමණ ඉදිරියට ගොස් වමට හැරී ෆ්‍රැන්සිස් පාරට ගොස් විෂය දේපළ ගාලු පාරේ සිට ඇවිද යා හැකි දුරින් ඇත. මැරීන් ඩ්‍රයිව් වෙතින් ද දේපල වෙත ප්‍රවේශ විය හැකිය.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් පාලන අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු ද, 3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු ද, 4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය ද, 5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව ලෙස රු. 2,000 ක් ද, 6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000 ක් ද වේ.

තවද, ගැණුම් මිලෙන් සියයට අනූවක් (90%)ක් වූ ඉතිරි මුදල විකිණීමේ දින සිට දින (30) තිහක් ඇතුලත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතු වේ. තවද දින (30) තිහක් ඇතුලත ඉතිරි මුදල නොගෙව්වහොත් ගෙවා ඇති සියයට දහය (10%) ක් මුදල අහිමි කිරීමට සහ එකී දේපළ නැවත විකිණීම ට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා වැඩි විස්තර සඳහා. - ජ්‍යෙෂ්ඨ කළමනාකාර - වාණිජ අයකිරීම්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011 - 2661833, 011- 2661836, 011- 2661826.

කේ. පී. එන්. සිල්වා (සා. වි.)
ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු, තක්සේරුකරු
හා උසාවි කොමසාරිස්.

අංක 109/12ඒ, ගෝතමී පාර,
බොරැල්ල, කොළඹ 08
දුරකථන අංක : 011- 4329335, 077 - 8441812.

12-440

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

පහසුකම් යොමු අංක - (සිංහ ලංකා රයිස් (ප්‍රයිවට්) ලිමිටඩ්, පීවී 114394 වෙත ලබාදුන් පහසුකම අඩ වශයෙන් පියවීම) 80120240, 81254475, 81256302.

දියබෙදුම, කටුකැලියාව, සිංහ ලංකා රයිස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි ලුණුගම විදානලාගේ ශානක විරාජ් ජයවික්‍රම මහතාට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2019.09.12 වැනි දින අංක 2141 දරන ගැසට් පත්‍රයේ හා 2019 සැප්තැම්බර් මස 2 වැනි සඳුද දින ''ඩේලිනිව්ස්'' ''දිනමිණ'' හා ''තිනකරන්'' යන පුවත්පත් වල පළකරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම **2023 ජනවාරි මස 04 වැනි දින පෙ. ව. 11.30** ට කොළොන්නාව විහාර මාවත, අංක 182/3 (50/3) හි ටී ඇන්ඩ් එච් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### පළමු උපලේඛනය

1. උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, ඇළහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවේ සිංහල පත්තුවේ, අංක 28 දරන කටුකැලියාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඉහකුළුවැව ග්‍රාමයේ පිහිටි "රජයේ ඉඩම" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ජී. රේණුකා අයෝනි විසින් සාදන ලද 2016.11.10 දිනැති අංක 1074 දරන පිඹුරෙහි ලොට් 02 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 02, උතුරට : FTP 25හි ලොට් අංක 350 සහ 413 ද, නැගෙනහිරට : FTP 25හි ලොට් අංක 413 සහ 352 ද, දකුණට : එකී අංක 1074 දරන පිඹුරෙහි ලොට් අංක 1 ද, බස්නාහිරට : FTP 25හි ලොට් අංක 350 ද මායිම්ව අක්කර එකක (අ. 1, රූ. 0, පර්. 0) හෙවත් හෙක්ටයාර බිංදුවයි දශම හතරයි බිංදුවයි හතරයි හතක (හෙක්. 0.4047) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ සමග වේ. මෙය පොළොන්නරුව දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO/E/27/169 හි ලියාපදිංචි කර ඇත.

#### දෙවන උපලේඛනය

පහත සඳහන් වෙන්කිරීම් හා කොන්දේසි පළමු උපලේඛනයේ සඳහන් දේපල අංක 1ට අදාළ වේ.

**වෙන්කිරීම් :**

1 ඉඩම තුළ හෝ ඒ මත ඇති සියලු ඛණිජ (මෙම යෙදුමට මෙම ප්‍රදානයේ දී වටිනා ගල් ද ඇතුළත් වේ.) වල හිමිකම සහ කැනීමට, සෝදිසි කිරීමට, වැඩ කිරීමට හා එවන් ඛණිජ බැහැරට ගෙනයාමට ඇති අයිතිය රජය වෙන් කර තබා ඇත.

2. ඉඩමට අයිතිකරු වශයෙන් ඇති හිමිකම මෙම ප්‍රදානය කරනු ලබන දිනයට ඉඩම මත පවතින මාර්ග අයිතිය හෝ ඉඩම මත ඇති අනෙකුත් පරවශතාවයන්ට යටත් වේ.

**කොන්දේසි :**

1. අයිතිකරු විසින් වාරි පහසුකම් ඇති ඉඩමෙන් හෙක්ටයාර 0.100 වශයෙන් මෙහි නම් කොට නිශ්චිතව දක්වා ඇති

බිම් ප්‍රමාණයකටම වඩා අඩු උප බෙදීම් ඒකකයක් මෙම ඉඩමෙන් බැහැර නොකළ යුතුය.

2. අයිතිකරු විසින් මෙහි වාරි පහසුකම් ඇති ගොඩ ඉඩමෙන් අක්කර/හෙක්ටයාර 1/4 ලෙස නම් කොට නිශ්චිතව දක්වා ඇති ඉඩම කොටසකට වඩා අඩු නොබෙදූ කොටසක් බැහැර නොකළ යුතුය.

3. කිසිවෙකුට ඉහත කොන්දේසි 1හි නිශ්චිතව දක්වා ඇති උප බෙදීම් ඒකකයකට වඩා ප්‍රමාණයෙන් අඩු බෙදන ලද කොටසක අයිතිකරුවකු විය නොහැක.

4. කිසිවෙකුට ඉහත කොන්දේසි 2හි නිශ්චිතව දක්වා ඇති උප බෙදීම් ඒකකයකට වඩා ප්‍රමාණයෙන් අඩු බෙදන ලද කොටසක අයිතිකරුවකු විය නොහැක.

5. ඉඩමට හෝ එහි කිසියම් කොටසකට ජලය සැපයිය හැකි නම් හෝ දැනටමත් ඉදිකර ඇති යම් වාරිමාර්ග කාර්යයන් ඉදිකිරීමක් හෝ ඉදිකිරීමට ඇති යමක් හේතුවෙන් ජලය සැපයිය හැකි බවට පත්වන්නේ නම් හෝ එම ජලය සැපයිය හැකි ප්‍රදේශ සම්බන්ධයෙන් අයිතිකරු වාරිමාර්ග ආඥාපනතේ (453 වගන්තිය) ඇති ප්‍රතිපාදනවලට අනුකූලව කටයුතු කළ යුතුය.

6. දිසාපතිගෙන් ලිඛිතව අවසරයක් සහ අදාළ අධිකාරිගෙන් බලපත්‍රයක් ලබා නොගෙන එම ඉඩම මත හෝ ඒ තුළ ඇති කිසිදු ඛණිජ ද්‍රව්‍යයන් හෑරීම, සෙවීම, භාවිතයට ගැනීම අයිතිකරු විසින් නොකළ යුතුය.

7. ප්‍රාදේශීය ලේකම්ගේ පූර්ව අනුමැතිය ලිඛිතව ලබා නොගෙන මෙම ඉඩම හෝ එහි ඕනෑම කොටසක් බැහැර නොකළ යුතුය.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. පී. ඩී. සී. සමරසිංහ මිය,
කළමනාකාරිණි.

2022 නොවැම්බර් මස 18 වැනි දින,
ලංකා බැංකුව,
දියබෙදුම.

12-431

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

පහසුකම් යොමු අංක - 7744394, 80120240, 81254475, 81256302 (සිංහ ලංකා රයිස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් පීවී 114394 වෙත ප්‍රදානය කළ පහසුකම්)

දියබෙදුම, කටුකැලියාව, සිංහ ලංකා රයිස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් හි ලුණුගම විදානලාගේ නදීෂ සුරාජ් සමිත ජයවික්‍රම මහතාට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2019.09.12 වැනි දින අංක 2141 දරන ගැසට් පත්‍රයේ හා 2019 සැප්තැම්බර් මස 2 වැනි සඳුදා දින ''ඩේලිනිව්ස්'' ''දිනමිණ'' හා ''තිනකරන්'' යන පුවත්පත් වල පළකරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍ර පිහිටි ස්ථානයේ දී ම **2023 ජනවාරි මස 04 වැනි බදාදා දින** පෙ. ව. 11.00 ට කොළොන්නාව විහාර මාවත, අංක 182/3 (50/3) හි ටී ඇන්ඩ් එච් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### පළමු උපලේඛනය

1. උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, ඇළහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවේ සිංහල පත්තුවේ, දියබෙදුම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඉහකුළුවැව ග්‍රාමයේ පිහිටි ''ස්ටේට් ලෑන්ඩ්'' නමැති ඉඩමේ සර්වේයර් ජනරාල් විසින් සහතික කරන ලද FTP 25 හි ලොට් 350 ලෙස දක්වා නිරූපණය කර ඇති ඉඩම් කැබැල්ල, උතුරට : ලොට් අංක 349 ගෙවතු ඉඩම ද, නැගෙනහිරට : අංක 413 දරන රජයේ ඉඩම ද, දකුණට : ලොට් අංක 351 ගෙවතු ඉඩම ද, බස්නාහිරට : ලොට් අංක 357 පාරට වෙන් කළ කොටස ද මායිම්ව අක්කර දෙකයි රූඩ් දෙකයි පර්චස් තිස් නවයක (අ. 2, රූ. 2, පර්. 39) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ සමග වේ. මෙය පොළොන්නරුව දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO/E/ 15/66 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ප්‍රේමරත්න විසින් මෑතකදී මැන සාදන ලද 2014.11.18 දිනැති අංක 2014/701 දරන පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කර ඇත.

එකී ඉහකුලුවැව ග්‍රාමයේ පිහිටි "ගොඩ ඉඩම" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ප්‍රේමරත්න විසින් සාදන ලද 2014.11.18 දිනැති අංක 2014/701 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා නිරූපණය කර ඇති ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් අංක 1, උතුරට : ලොට් අංක 349 ද, නැගෙනහිරට : ලොට් අංක 413 ද, දකුණට : ලොට් අංක 351 ද, බස්නාහිරට : ලොට් අංක 357 ද මායිම්ව අක්කර දෙකයි රූඩ් දෙකයි පර්චස් තිස් නවයක (අ.2, රූ.2, පර්.39) හෙවත් හෙක්ටයාර එකයි දශම එකයි එකයි බිංදුවයි හතරක (හෙක්. 1.1104) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ සමග වේ.

### දෙවන උපලේඛනය

**වෙන්කිරීම් :**

1. ඉඩම තුළ හෝ ඒ මත ඇති සියලු ඛණිජ (මෙම යෙදුමට මෙම ප්‍රදානයේදී වටිනා ගල් ද ඇතුළත් වේ.) වල හිමිකම සහ කැනීමට, සෝදිසි කිරීමට, වැඩ කිරීමට හා එවන් ඛණිජ බැහැරට ගෙනයාමට ඇති අයිතිය රජය වෙත වෙන් කර තබා ඇත.

2. ඉඩමට අයිතිකරු වශයෙන් ඇති හිමිකම මෙම ප්‍රදානය කරනු ලබන දිනයට ඉඩම මත පවතින මාර්ග අයිතිය හෝ ඉඩම මත ඇති අනෙකුත් පරවශතාවයන්ට යටත් වේ.

**කොන්දේසි :**

1. අයිතිකරු විසින් ගොඩ ඉඩමෙන් අක්කර 1/4 වශයෙන් මෙහි නම් කොට නිශ්චිතව දක්වා ඇති බිම් ප්‍රමාණයකටම වඩා අඩු උප බෙදීම් ඒකකයක් මෙම ඉඩමෙන් බැහැර නොකළ යුතු ය.

2. අයිතිකරු විසින් මෙහි අක්කර 1/4 ලෙස නම් කොට නිශ්චිතව දක්වා ඇති ඉඩම කොටසකට වඩා අඩු නොබෙදූ කොටසක් බැහැර නොකළ යුතු ය.

3. කිසිවෙකුට ඉහත කොන්දේසි 1 හි නිශ්චිතව දක්වා ඇති උප බෙදීම් ඒකකයකට වඩා ප්‍රමාණයෙන් අඩු බෙදන ලද කොටසක අයිතිකරුවකු විය නොහැක.

4. කිසිවෙකුට ඉහත කොන්දේසි 2 හි නිශ්චිතව දක්වා ඇති උප බෙදීම් ඒකකයකට වඩා ප්‍රමාණයෙන් අඩු බෙදන ලද කොටසක අයිතිකරුවකු විය නොහැක.

5. ඉඩමට හෝ එහි කිසියම් කොටසකට ජලය සැපයිය හැකි නම් හෝ දැනටමත් ඉදිකර ඇති යම් වාරිමාර්ග කාර්යයන් ඉදිකිරීමක් හෝ ඉදිකිරීමට ඇති යමක් හේතුවෙන් ජලය සැපයිය හැකි බවට පත්වන්නේ නම් හෝ එම ජලය සැපයිය හැකි ප්‍රදේශ සම්බන්ධයෙන් අයිතිකරු වාරිමාර්ග ආඥාපනතේ (453 වගන්තිය) ඇති ප්‍රතිපාදනවලට අනුකූලව කටයුතු කළ යුතු ය.

6. දිසාපතිගෙන් ලිඛිතව අවසරයක් සහ අදාළ අධිකාරිගෙන් බලපත්‍රයක් ලබා නොගෙන එම ඉඩම මත හෝ ඒ තුළ ඇති කිසිදු ඛණිජ ද්‍රව්‍යයන් හෑරීම, සෙවීම, භාවිතයට ගැනීම අයිතිකරු විසින් නොකළ යුතු ය.

7. ප්‍රාදේශීය ලේකම්ගේ පූර්ව අනුමැතිය ලිඛිතව ලබා නොගෙන මෙම ඉඩම හෝ එහි ඕනෑම කොටසක් බැහැර නොකළ යුතු ය.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. පී. ඩී. සී. සමරසිංහ මිය,
කළමනාකාරිණී.

2022 නොවැම්බර් මස 18 වැනි දින,
ලංකා බැංකුව,
දියබෙදුම.

12-432

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - (මඩකලපුව ශාඛාව)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

### උපලේඛනය

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර් පතු - වෙන්කලාඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, එරාවූර් පතු වෙන්කලාඩි ප්‍රාදේශීය සභා සීමා ඇතුලත වෙන්කලාඩි -1 ග්‍රාම සේවක කොට්ඨාසය තුළ වෙන්කලාඩි හි පුතූර් ගමේ පිහිටි ''කුඩාරමවාඩි පූමි'' නමැති ඉඩමේ කොටසක දකුණු බටහිර කොටසේ දකුණු නැගෙනහිර කෙළවරේ බෙදා මායිම් නියම කරන ලද කොටසක කොටස

ප්‍රමාණය පර්චස් තිස් හතරයි දශම දෙකයි හතර (පර්. 34.24) හෙවත් හෙක්ටයාර් 0.0866 ක විශාල ඉඩම සමග ගොඩනැගිලි, ළිඳ සහ එහි ඇති අනෙකුත් සියළු අයිතීන් සමගා වේ.

මහින්ද්‍රා හාඩ්වෙයාර් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල්ස් යන නාමය, විලාසය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස ව්‍යාපාරය පවත්වාගෙන යන කනපතිපිල්ලෙයි මහෙන්තිරකුමාර් ණයකරු හැටියට කොමර්ෂල්

බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ **2023ක් වූ ජනවාරි මස 26 වැනි දින පෙ. ව. 10.00 ට** ඉහත ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*යෝජනා සම්මුතිය සඳහා* 2021.04.23 වැනි දින රජයේ *ගැසට් පත්‍රයද* , 2021.04.23 වැනි දින දිවයින, ඩේලිනිවුස් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*දේපල වෙත පිවිසීම.* - චෙන්කලාඩි හංදියේ සිට මාර්කට් පාර ඔස්සේ මීටර් 240 ක පමණ දුරක් ගමන් කර මාර්කට් පාර 2 වන මංසන්ධියකට දකුණට හැරී මීටර් 50 ක පමණ දුරක් ගමන් කළ විට දේපළ මෙම මාර්ගයට මායිම්ව වමේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) ලිපිකරු හා සෝෂක වේතනය රු. 2,000, (05) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (06) ගැණුම්කරු විසින් අකාලික වටිනාකම බද්ද (VAT) ගෙවිය යුතුයි. (07) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ මඩකලපුව ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID - 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල උසාවි පාර,
කොළඹ 12.
දුරකතන/ෆැක්ස් : 011- 2445393
ඊමේල් : senaservice84@gmail.com

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 42,
බාර් පාර, මඩකලපුව.

දුරකතන අංක : 065 - 2226401
ෆැක්ස් අංකය : 065 - 2226404

12-419

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. -**
**(දංකොටුව ශාඛාව)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

*උපලේඛනය*

(1) වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පලාවිය, අංක 607 ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුලත පුත්තලම ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුලත පුත්තලම ප්‍රාදේශීය සභා සීමා ඇතුලත පුත්තලම පත්තු උතුර පුත්තලම පත්තු කෝරළයේ තුරුවිකුලම ගමේ පිහිටි ''මුල්ලුවෙලි'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. ගුහානන්දන් විසින් 2015.12.28 වැනි දින පිළියෙල කරන ලද අංක 3236 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස.

ප්‍රමාණය රූඩ් දෙකයි පර්චස් තිස් හතයි දශම හයයි හය (රූ. 2, පර්. 37.66) ක විශාල ඉඩම සමග ගොඩනැගිල්ල, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමග වේ.

(2) වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පලාවිය, අංක 607 ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුලත පුත්තලම ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුලත පුත්තලම ප්‍රාදේශීය සභා සීමා ඇතුලත පුත්තලම පත්තු උතුර පුත්තලම පත්තු කෝරළයේ තුරුවිකුලම ගමේ පිහිටි ''මුල්ලුවෙලි'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. ගුහානන්දන් විසින් 2015.12.28 වැනි දින පිළියෙල කරන ලද අංක 3235 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස.

ප්‍රමාණය : රූඩ් දෙකයි පර්චස් තිස් හතයි දශම හයයි හය (රූ. 2, පර්. 37.66) ක විශාල ඉඩම සමග ගොඩනැගිල්ල, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමග වේ.

ශ්‍රී ලංකාවේ නීති යටතේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක් වන නයිනමඩම බටහිර, ජෙරනිමුස් මාවතේ, ''ශ්‍රී'' අංක 167 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති දිනේසා ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපල

1 වන දේපළ වර්ෂ **2023 ක් වූ ජනවාරි මස 12 වැනි දින පෙ. ව. 11.30 ට**

2 වන දේපළ වර්ෂ **2023ක් වූ ජනවාරි මස 12 වැනි දින ප. ව. 12.00** ට ඉහත ස්ථාන වලදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2021.07.22 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2021.07.30 වැනි දින දිවයින, ඩේලිනිවුස් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*දේපල වෙත පිවිසීම.* - හලාවත නගරයේ සිට පුත්තලම පාර ඔස්සේ කිලෝමීටර් 47ක් පමණ ගමන් කර පලාවි හංදිය පසුකර මීටර් 250ක් පමණ සහ පුත්තලම නගරයට කිලෝමීටර් 04.5 කට පමණ කළින් දකුණු අත පැත්තේ පිහිටි ප්‍රධාන විෂයගත දේපල වෙත ළඟා විය හැක. පලාවි සිංහල මහා විද්‍යාලයට විරුද්ධව (දිනේසා ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමටඩ් නාම පුවරුව සමග)

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) ලිපිකරු හා සෝෂක වේතනය රු. 2,000, (05) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (06) ගැණුම්කරු විසින් අකාලික වටිනාකම බද්ද (VAT) ගෙවිය යුතුයි. (07) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ දංකොටුව ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් Covid-19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල උසාවි පාර,
කොළඹ 12.
දුරකතන : 011- 2396520
ඊමේල් : senaservice84@gmail.com

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 38,
මීගමුව පාර, දංකොටුව.

දුරකතන අංක : 031 - 2261211
ෆැක්ස් අංකය : 031 - 2261214

12-418

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - (මීගමුව දෙවන ශාඛාව)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**උපලේඛනය**

*ඉඩමේ විස්තර .-*

හිමිකම් සහතිකය : 00212501380

| | | | |
|---|---|---|---|
| (a) | පළාත | : | වයඹ |
| (b) | දිස්ත්‍රික්කය | : | කුරුණෑගල |
| (c) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : | පන්නල |
| (d) | ග්‍රාම නිලධාරි කොට්ඨාසය | : | 1590, එලිවිල්ල |
| (e) | ගම සහ නගරය | : | එලිවිල්ල ගම |
| (f) | වීදිය | : | -- |
| (g) | වරිපනම් අංකය | : | -- |
| (h) | කැඩැස්තර සිතියම් අංකය | : | 420512 |
| (i) | කැබැලි අංකය | : | 01 |
| (j) | පාර්සල් අංකය | : | 0146 |
| (k) | ප්‍රමාණය | : | හෙක්ටයාර් 0.1863 |
| (l) | උකසට තැබූ ඉඩමේ ප්‍රමාණය | : | හෙක්ටයාර් 0.1863 |
| (m) | සහාධිපත්‍යය දේපල නම් ඒකක සංඛ්‍යාව | : | |

තවද කුලියාපිටිය හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

කුලියාපිටිය, මඩකුඹුර මුල්ල, බිබිලදෙනිගම හි ඇඹුල්දෙණියේ සුසන්ත ඇඹුල්දෙණිය ණයකරු හැටියට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ **2023 ක් වූ ජනවාරි මස 13 වැනි දින පෙ. ව. 11.00** ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2021.03.12 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2021.03.12 වැනි දින දිවයින, ඩේලිනිවුස් සහ වීරකේසරී පුවත්පත් වල පළ කර ඇත.

*ඉඩමට පිවිසීම.* - මාකදුර නගරයේ සිට කුරුණෑගල පාර ඔස්සේ ගමන් කර කදනෙගෙදර පාරට වමට හැරී කිලෝමීටර් 2ක් පමණ ගමන් කර පන්සල පසුකර මීටර 50ක් පමණ පාර වෙන්කිරීමකට වමට හැරී ගමන් කළ විට මීටර් 100ක් පමණ ඇතින් දකුණේ අදාළ දේපල පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය. - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) ලිපිකරු හා සෝෂක වේතනය රු. 2,000, (05) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (06) ගැණුම්කරු විසින් අකාලික වටිනාකම බද්ද (VAT) ගෙවිය යුතුයි. (07) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ මීගමුව දෙවන ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල, උසාවි පාර,
කොළඹ 12.
දුරකතන : 011- 2396520
ඊමේල් : senaservice84@gmail.com

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 314
කොළඹ පාර,
මීගමුව.

දුරකතන අංක : 031 - 2225280/031 - 2225279
ෆැක්ස් අංකය : 031 - 2225281.

12-421

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - ගණේමුල්ල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

### 1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 269/ඒ මාවරමණ්ඩිය ග්‍රාම නිලධාරි වසම ඇතුලත වරිපනම් අංක 16/4 සහ 16/8 දරන ඉහල බියන්විල පිහිටි ''කොස්ගහලන්ද සහ කහටගහවත්ත'' ලෙස හඳුන්වන දැන් ඔරෙන්ජ් බිල් එස්ටේට් ලෙස නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. සී. ඇපාසිංහ විසින් 2016.09.20 වැනි දින පිළියෙල කරන ලද අංක 2049 දරන පිඹුරෙන් බෙදා වෙන්කරන ලද ලොට් 71 සී දරන

ප්‍රමාණය රූඩ් එකයි පර්චස් දහසයයි දශම දෙකයි හය (රූ. 1, පර්. 16.26) විශාල ඉඩම සමග ගොඩනැගිලි, පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමඟ වේ.

බලයලත් මිනින්දෝරු ඩබ්. සෙනවිරත්න විසින් 1998.02.03 වැනි දින පිළියෙල කරන ලද අංක 5052 දරන පිඹුරේ ලොට්ස් ආර් 5, ආර් 7, ආර් 13 සහ ආර් 8 මතින් සහ දිගේ මාර්ග අයිතිය සමඟ වේ.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ මැද පත්තුවේ ගම්පහ ප්‍රාදේශීය සභා සීමාව තුළ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 235 බී ඉහළ යාගොඩ උතුර ග්‍රාම නිලධාරි වසම තුළ ඉහළ යාගොඩ පිහිටි ''දම්බුගහවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. බී. ජයසේකර විසින් 2016.06.10 වැනි දින පිළියෙල කරන ලද අංක 21458 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 2 ඒ දරන

ප්‍රමාණය පර්චස් විස්සක් (පර්. 20) විශාල ඉඩම සමඟ ගොඩනැගිලි, සහ එහි පිහිටි සියලු දේත් සමඟ වේ.

### තුන්වන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ මැද පත්තුවේ ගම්පහ ප්‍රාදේශීය සභා සීමාව තුළ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉහළ යාගොඩ උතුර 235 බී ග්‍රාම නිලධාරි වසම තුළ ඉහළ යාගොඩ පිහිටි ''ගොරකගහවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඒ. ඒ. පෙරේරා විසින් 2016.03.04 වැනි දින පිළියෙල කරන ලද අංක 1314 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 12 ඒ දරන

ප්‍රමාණය පර්චස් විස්සක් (පර්. 20)
විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමඟ වේ.

ශ්‍රී ලංකාවේ නීති යටතේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක් වන ගම්පහ, උසාවි පටුමගේ, අංක 10/ඒ දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ජේ ඇන්ඩ් ජේ ක්‍රෙඩිට් ඩිවෙලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට පළමුවන උපලේඛනයේ සඳහන් දේපළ උකස් කර ඇත.

ඉහත දෙවන සහ තුන්වන උපලේඛනවල සඳහන් දේපළ ශ්‍රී ලංකාවේ නීති යටතේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක් වන ගම්පහ, උසාවි පටුමගේ, අංක 10/ඒ දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ජේ ඇන්ඩ් ජේ ක්‍රෙඩිට් ඩිවෙලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස සහ ජයසූරිය ආරච්චිගේ දිනූෂා රසාංගනි ජයසූරිය උකස්කරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කර ඇත.

**පළමුවන උපලේඛනය වර්ෂ 2023 ක්වූ ජනවාරි මස 18 වැනි දින පෙ. ව. 10.00 ට ද,**

**දෙවන උපලේඛනය වර්ෂ 2023 ක්වූ ජනවාරි මස 18 වැනි දින පෙ. ව. 11.00 ට ද,**

**තුන්වන උපලේඛනය වර්ෂ 2023 ක්වූ ජනවාරි මස 18 වැනි දින පෙ. ව. 11.30 ට ද,**

ඉහත ස්ථානවල දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2019.05.31 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, දිවයින, ඩේලිනිවුස් සහ වීරකේසරී පුවත්පත් වල පළ කර ඇත.

*ඉඩම්වලට පිවිසීම්.-*

**පළමුවන උපලේඛනය**

කඩවත නගර මධ්‍යයේ සිට මංකඩ පාර ඔස්සේ කිලෝමීටර් 3.3ක් පමණ ගමන් කර බුළුගහවත්ත පාරට වමට හැරී (මාවරමංඩිය බුදු පිළිම හංදියට මීටර් 150 ක් කළින්) ''ටී'' හංදිය දක්වා තවත් මීටර් 500 ක් පමණ ගමන් කර අනතුරුව ඔරෙන්ජ් බිල් වත්ත යෝජනා ක්‍රම පාරට දකුණට හැරී තවත් මීටර් 25ක් ගමන් කර අනතුරුව ඔරෙන්ජ් බිල් වත්ත පාරට වමට හැරී තවත් මීටර් 25ක් පමණ ගමන් කර, ඔරෙන්ජ් බිල් වත්ත 1 වන පටුමගට වමට හැරී තවත් මීටර් 40ක් පමණ ගමන් කර අනතුරුව ඔරෙන්ජ් බිල් වත්ත 1 වන පටුමග A පාරට (අඩි 15 පළල බොරළු පාර) දකුණට හැරී තවත් මීටර් 50ක් පමණ ගමන් කළ විට පාර අන්තයේ පිහිටි විෂයගත දේපල වෙත ළඟා විය හැක.

**දෙවන උපලේඛනය**

කඩවත නගර මධ්‍යයේ සිට තාර දමන ලද කොළඹ - නුවර ප්‍රධාන පාරේ (A 1) යක්කල දෙසට කිලෝමීටර් 7 ක පමණ දුරක් ගමන් කර ''ට්‍රැක්මෝ'' හංදිය දක්වා පැමිණ අනතුරුව තාර දමන ලද ඉහළ යාගොඩ පාරට වමට හැරී දකුණු අත පැත්තේ ඇති අඩි 20 පළල තාර දමන ලද, ආරාමය, පාර දක්වා කිලෝ මීටර් 2 ක් පමණ ගමන් කර අනතුරුව දකුණට හැරී ''ආරාමය'' ට විරුද්ධව නැවත දකුණු පැත්තේ අඩි 10 පළල බොරළු පාර දක්වා තවත් මීටර් 200ක් ගමන් කර අවසානයේ දී, දකුණට හැරී තවත් මීටර් 75ක් ගමන් කළ විට වම් අත පැත්තේ ඇති අදාළ දේපළ වෙත ළඟා විය හැක.

**තුන්වන උපලේඛනය**

කඩවත නගර මධ්‍යයේ සිට කොළඹ - නුවර ප්‍රධාන පාරේ (A 1) යක්කල දෙසට කිලෝමීටර් 7 ක පමණ දුරක් ගමන් කර ට්‍රැක්මෝ හංදිය දක්වා පැමිණ අනතුරුව තාර දමන ලද පහළ යාගොඩ පාරට වමට හැරී දකුණු අත පැත්තේ ඇති අඩි 15 පළල තාර දමන ලද මිහිඳු මාවත දක්වා කිලෝමීටර් 2.8ක් පමණ ගමන් කර මීටර් 150 ක් ඉදිරියට ''ලොව්ගහමුල'' හංදියට පැමිණ අවසානයේ දී, දකුණට හැරී තවත් මීටර් 25ක් ගමන් කර දකුණු අත පැත්තේ ඇති අදාළ දේපළ වෙත ළඟා විය හැක.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) ලිපිකරු හා සෝෂක වේතනය රු. 2,000, (05) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (06) ගැණුම්කරු විසින් එකතුකළ වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි. (07) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ ගණේමුල්ල ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල උසාවි පාර,
කොළඹ 12.
දුරකතන : 011- 2396520
ඊමේල් : senaservice84@gmail.com

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 289,
කඩවත පාර,
ගණේමුල්ල.

දුරකතන අංක : 033 - 2261796 - 7
ෆැක්ස් අංකය : 033 - 2261297

12-422

## යුනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

### උපලේඛනය

(1) ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, යටිකින්ද කොට්ඨාසයේ, රිල්පොල කෝරළයේ, කැන්දලගම, බදුල්ල නගරයේ සහ කඩවත් සතර, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 78 B දරන නැගෙනහිර බදුල්ල ග්‍රාම නිලධාරි වසමේ, වර්තමානයේ මුතියංගන පාරේ සහ කලින් කැන්දලගම පිහිටි ''ඔයවල්ඉනේවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර විසින් මැන සාදන ලද අංක 2A/9/2010 සහ 2010.09.04 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 01 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටස.

ප්‍රමාණය පර්චස් දාහතකුත් දශම පහයි බිංදුවක් (පර්. 17.50)

විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ/193/08 යටතේ ලියාපදිංචි කරන ලදුව, වර්තමානය වන විට බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ/193/104 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචිය වෙත ඉදිරියට ගෙන ගොස් ඇත.

(2) ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, යටිකින්ද කොට්ඨාසයේ, රිල්පොල කෝරළයේ, කැන්දලගම, බදුල්ල නගරයේ සහ කඩවත් සතර, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වර්තමානයේ මුතියංගන පාරේ සහ කලින් කැන්දලගම පිහිටි ''ඔයවල්ඉනේවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර විසින් මැන සාදන ලද අංක 2A/9/2010 සහ 2010.09.14 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 02 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටස.

ප්‍රමාණය පර්චස් දාහතකුත් දශම පහයි බින්දුවක් (පර්. 17.50)

විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A/193/09 යටතේ ලියාපදිංචි කරන ලදුව, වර්තමානය වන විට බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක A/193/105 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචිය වෙත ඉදිරියට ගෙන ගොස් ඇත.

(3) ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, යටිකින්ද කොට්ඨාසයේ, රිල්පොල කෝරළයේ, කැන්දලගම, බදුල්ල නගරයේ සහ කඩවත් සතර, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වර්තමානයේ මුතියංගන පාරේ සහ කලින් කැන්දලගම පිහිටි ''ඔයවල්ඉනේවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර විසින් මැන සාදන ලද අංක 2A/9/2010 සහ 2010.09.04 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 03 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන් කළ බිම් කොටස.

ප්‍රමාණය පර්චස් දාහතකුත් දශම පහයි බිංදුවක් (පර්. 17.50)

විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A/193/10 යටතේ ලියාපදිංචි කරන ලදුව, වර්තමානය වන විට බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක A/193/106 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචිය වෙත ඉදිරියට ගෙන ගොස් ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, බදුල්ල, මයිලගස්තැන්න, ඥානවිමල මාවත, අංක 12 දරන ස්ථානයේ පදිංචි ''උදාරාස් කන්ස්ට්‍රක්ෂන්'' යන නාමය, විලාසය සහ අභිධානය යටතේ තනි හිමිකාර ව්‍යාපාරයක් පවත්වාගෙන යන (ඌව පළාතේ ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්ගේ ව්‍යාපාර නාම ලියාපදිංචි අංක U - 16 දරන), විජේසිංහ ආරච්චිලාගේ ධම්මික ශ්‍රියලාල් විජේසිංහ (ජාතික හැඳුනුම්පත් අංක 632210418 V දරන) (මෙහි මින්මතු ඇතැම් තැනක ''බන්ධනදායි'' වශයෙන් හඳුන්වන) යන අය විසින් සමාගම් ලියාපදිංචි කිරීමේ අංක PB676PQ දරන යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින්මතු යුනියන් බැංකුව වශයෙන් හඳුන්වන) වෙතින් මූල්‍ය පහසුකම් ගණනාවක් (මෙහි මින්මතු ''ප්‍රතිලේඛනගත කාලීන ණය'' වශයෙන් හඳුන්වන)ලබාගෙන ඇති බැවින් ද, එකී බන්ධනදායි මුදලක් සඳහා ප්‍රසිද්ධ නොතාරිස් එස්. ජයසිංහ විසින් සහතික කරන ලද අංක 5942 සහ 2016.07.12 දිනැති පවතින ප්‍රාථමික උකස් බැඳුම්කරය සහ අංක 5988 සහ 2016.10.12 දිනැති පවතින ද්විතියික උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට තබා, යුනියන් බැංකුව වෙත අයවිය යුතු එකී මූල්‍ය පහසුකම් සහ ඒ මත පොළිය ගෙවීම පිණිස මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වෙන දේපළ ඇපයක් වශයෙන් උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, යුනියන් බැන්ක් ඔෆ් කළම්බු පී එල් සී විසින් මා හට පවරා ඇති බලය ප්‍රකාරව,

**උපලේඛනයේ දක්වෙන දේපළ ලොට් 01 වර්ෂ 2023 ක්වූ ජනවාරි මස 25 වැනි දින පෙ. ව. 10.00 ටත්**

**උපලේඛනයේ දක්වෙන දේපළ ලොට් 02 වර්ෂ 2023 ක්වූ ජනවාරි මස 25 වැනි දින පෙ. ව. 10.15 ටත්**

**උපලේඛනයේ දක්වෙන දේපළ ලොට් 03 වර්ෂ 2023 ක්වූ ජනවාරි මස 25 වැනි දින පෙ. ව. 10.30 ටත්**

දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළ වෙත පිවිසීම.

### උපලේඛනය

බදුල්ල ප්‍රධාන බස් නැවතුම්පොළේ සිට පස්සර පාර ඔස්සේ කිලෝමීටර් 01ක් පමණ ගමන් කර CTB ඩිපෝවට පෙර මීටර් 100 පමණ හි දී පාරේ වම් අත පැත්තේ පිහිටි විෂයගත දේපල වෙත ළඟා විය හැක.

*ගෙවීම් කළ යුතු ආකාරය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) ඉතිරි සියයට අනුව 90% ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුලත යූනියන් බැන්ක් ඔෆ් කළම්බො පී එල් සී හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය .
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(04) පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
(05) ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
(06) ලිපිකරු හා සෝෂක වේතනය රු. 2,500,
(07) නොතාරිස් ගාස්තු සහ අනෙකුත් වියදම් රු. 4,500.

වෙනත් කරුණු සඳහා පහත සඳහන් නිලධාරින්ගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්.

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය,
බලයලත් වෙන්දේසිකරු රාජ්‍ය සහ වාණිජ බැංකු,
අංක 200, 2 වන මහළ, හල්ස්ඩ්‍රොෆ් වීදිය, කොළඹ 12 ,
දුරකතන අංක 011 2396520

නීති දෙපාර්තමේන්තුව,
යූනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී,
අංක 64, ගාලු පාර,
කොළඹ 03.
දුරකථන අංක : 011 - 2347100.

12-426

---

**අමානා බැන්ක් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

**උපලේඛනය**

ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, අක්කරෙයි-පත්තුවේ ආලේයිඅඩිවෙම්බු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආලේයිඅඩිවෙම්බු ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත කුරුන්කොඩිත්තිව් - 09 හි පිහිටා ඇත්තාවූ ද, ''කන්ඩකුලි'' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා කල්මුනේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ පිළිවෙලින් M/208/164 සහ M/133/79 හි ලියාපදිංචි වී ඇත්තාවූ ද ප්‍රමාණයෙන් රූඩ් තුනයි (03) පර්චස් පහක් (05) වූ ද (රූ. 3, පර්. 5) සහ අක්කර එකයි (01) රූඩ් දෙකක් වූ (අ. 1, රූ. 2) ඉඩම යන ඉඩම්වල ඒකාබද්ධ ඉඩම් කැබැල්ලක් වූ ද, වර්තමානයේ දී, ප්‍රමාණය අක්කර දෙකයි පර්චස් තිස් හතයි දශම හතක් (අ. 2, පර්. 37.7) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි පස, ගොඩනැගිලි, ගහකොළ වැවිලි පළතුරු ආදී සෑම සියලු දේත් සමග වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 486, ගාලු පාර, කොළඹ 03 යන ලිපිනයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇත්තාවූ ද, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වූ ද, ලියාපදිංචි අංක PB 3618 PQ දරන අමානා බැන්ක් පී. එල්. සී. ආයතනය වෙනුවෙන් කල්මුනේ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. රකීබ් විසින් සහතික කරන ලද 2013 ඔක්තෝබර් මස 03 වැනි දින අංක 1013 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම ''බන්ධනදයින්'' යනුවෙන් හඳුන්වනු ලබන එම්. අයි. එම්. ස්ටෝර්ස් යන නාමය, විලාසය සහ අභිධානය යටතේ පරම අයිතිකරුවකු වශයෙන් ව්‍යාපාරික කටයුතු සිදු කරනු ලබන මොහොමඩ් ඉස්මායිල් මුෆීස් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, අමානා බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාරව,

උපලේඛනයේ දැක්වෙන දේපළ වර්ෂ **2023 ක් වූ ජනවාරි මස 19 වැනි දින පෙ. ව. 10.00 ට** දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - අක්කරෙයිපත්තු නගරයේ ඔරලෝසු කණුවේ සිට පොතුවිල් පාර ඔස්සේ කිලෝමීටර් 1.2ක් පමණ ගමන් කර වංගුව පසුකරනවාත් සමග මහා මාර්ගයට මුහුණ ලා දකුණු අත පැත්තේ පිහිටි විෂයගත දේපල වෙත ළඟා විය හැක.

*ගෙවීම් කළ යුතු ආකාරය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) ඉතිරි සියයට අනුව 90% ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුලත අමානා බැන්ක් පී එල් සී හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය .
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(04) පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
(05) ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
(06) ලිපිකරු හා සෝෂක වේතනය රු. 2,000,
(07) නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 4,000.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID - 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

අනෙකුත් තොරතුරු සඳහා පහත සඳහන් නිළධාරින්ගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්.

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය,
බලයලත් වෙන්දේසිකරු රාජ්‍ය සහ වාණිජ බැංකු,
අංක 200, 2 වන මහළ, හල්ස්ඩෝෆ් විදිය, කොළඹ 12 ,
දුරකථන අංක : 0112 - 396520

අයකිරීම් අංශය,
අමානා බැන්ක් පී. එල්. සී.,
අංක 486, ගාළු පාර,
කොළඹ 03.
දුරකථන අංක : 011 - 5238370
යොමුව : 2112

12-420

---

## අමානා බැන්ක් පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

### උපලේඛනය

1 වන ඉඩම.-

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, අක්කරෙයිපත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අක්කරෙයිපත්තුව මහ නගර සභා සීමාව ඇතුළත කරුන්කොඩිත්තීව් - 09 හි පිහිටා ඇත්තාවූ ද, ''කන්ඩක්කුලි මුන්මාරි'' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම ප්‍රමාණයෙන් (අ. 2,) වූ ද (අක්කර දෙකයි) කල්මුනේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක P 01/62 දරන පත්තිරුවේ ලියාපදිංචි වී ඇති ඉහත කී බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ ඒ මත වූ වෙනත් සියලු දේද වේ.

2 වන ඉඩම. -

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, අක්කරෙයිපත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අක්කරෙයිපත්තුව මහ නගර සභා සීමාව ඇතුළත කරුන්කොඩිත්තීව් - 08 හි පිහිටා ඇත්තාවූ ද, ''කන්දක්කුලි මුන්මාරි'' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම ප්‍රමාණයෙන් (රූඩ් 3) වූ ද (රූඩ් තුනක්) වූ කල්මුනේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ M198/95 දරන පත්තිරුවේ ලියාපදිංචි වී ඇති බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ ඒ මත වූ වෙනත් සියලු දේද වේ.

3 වන ඉඩම. -

T. P. 6112 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් (අ. 01) වූ ද බලයලත් මිනින්දෝරු ඒ. සී. එම්. තයියුබ් විසින් සාදන ලද 2015.05.06 වැනි දින අංක 368 දරන පිඹුරේ මෑත කාලීන මැනීමකට සහ විස්තරයකට අනුව ප්‍රමාණයෙන් අ. 01, පර්. 19.7 වූ ද 833 කන්ඩම්, නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ අක්කරෙයිපත්තුව ආලේයිඅඩිවෙම්බු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආලේයිඅඩිවෙම්බු ප්‍රාදේශීය සඳහා සීමාව ඇතුළත කරුන්කොඩිත්තීව් 9 කොට්ඨාසයේ පිහිටා ඇත්තාවූ ද, ''කන්ඩාල් කලතු මුන්මාරි'' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම, කල්මුනේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක P05/129 දරන පත්තිරුවේ ලියාපදිංචි වී ඇති ඉහත කී බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ මත වූ වෙනත් සියලු දේ ද වේ.

බලයලත් මිනින්දෝරු එස්. සින්නලෙබ්බේ විසින් සාදන ලද 2015.07.23 දින පිඹුරු අංක 425 දරන මෑත කාලීන මැනීමකට සහ විස්තරයකට අනුව ඉහත කී ඉඩම් කොටස් පහත පරිදි විස්තර කරනු ලැබේ.

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, අලේයිඅඩිවෙම්බු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අලේයිඅඩිවෙම්බු ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත කරුන්කොඩිත්තීව් 09 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හෙවත් වර්තමානයේ දී අක්කරෙයිපත්තුව 09 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිහිටා අත්තාවූ ද, ''කන්ඩක්කුලි මුන්මාරි'' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමේ ලොට් අංක 01 ලෙස බෙදා වෙන්කරන ලද ඉඩම.

ප්‍රමාණය (අ. 03, රූ. 03, පර්. 20) හෙවත් හෙක්ටයාර් 1.5679
විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි පස, ගොඩනැගිලි, ගහකොළ වැවිලි පළතුරු ආදී සෑම සියලු දේත් සමග වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 486, ගාලු පාර, කොළඹ 03 යන ලිපිනයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇත්තාවූ ද, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වූ ද, ලියාපදිංචි අංක PB 3618 PQ දරන අමානා බැන්ක් පී. එල්. සී. ආයතනය වෙනුවෙන් අම්පාර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. රෝසාන් අක්කාර් විසින් සහතික කරන ලද 2015 ජූලි මස 29 වැනි දින අංක 317 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම ''බන්ධනදායින්'' යනුවෙන් හඳුන්වනු ලබන එම්. අයි. එම්. ස්ටෝර්ස් යන නාමය, විලාසය සහ අභිධානය යටතේ පරම අයිතිකරුවකු වශයෙන් ව්‍යාපාරික කටයුතු සිදු කරනු ලබන මොහොමඩ් ඉස්මායිල් මුෆීස් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, අමානා බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාරව,

ඉහත සඳහන් දේපළ වර්ෂ **2023 ක්වූ ජනවාරි මස 19 වැනි දින** පෙ. ව. 11.00 ට ද දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - අක්කරෙයිපත්තු නගරයේ ඔරලෝසු කණුවේ සිට පොතුවිල් පාර ඔස්සේ විෂයගත දේපළට මග පෙන්වන පටු මගක් දක්වා කිලෝමීටර් 1.4ක් පමණ ගමන් කර වමට හැරී මීටර් 75ක් පමණ පටුමග ඔස්සේ ගමන් කළ විට මෝටර් රථ ප්‍රවේශවිය හැකි පටුමගට මුහුණ ලා ඔබ ඉදිරිපිට පිහිටි විෂයගත දේපළ වෙත ළඟා විය හැක.

*ගෙවීමේ කළ යුතු ආකාරය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(02) ඉතිරි සියයට අනුව 90% ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත අමානා බැන්ක් පී එල් සී හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය .
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(04) පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
(05) ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
(06) ලිපිකකරු හා සෝෂක වේතනය රු. 2,000,
(07) නොතාරිස් ගාස්තු සහ අනෙකුත් වියදම් රු. 4,000.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID - 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

අනෙකුත් තොරතුරු සඳහා පහත සඳහන් නිළධාරින්ගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්.

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය,
බලයලත් වෙන්දේසිකරු රාජ්‍ය සහ වාණිජ බැංකු,
අංක 200, 2 වන මහළ, හල්ස්ඩ්‍රොෆ් විදිය, කොළඹ 12 ,
දුරකතන අංක : 0112 - 396520

අයකිරීම් අංශය,
අමානා බැන්ක් පී. එල්. සී.,
අංක 486, ගාලු පාර,
කොළඹ 03.
දුරකථන අංක : 011 - 5238370
යොමුව : 2112

12-423

## ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී
## (ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අනුප්‍රාප්තික)

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසිය

පානදුර කෙසෙල්වත්තේ පිහිටි පර්චස් 19.51 විශාලැති අගනා බිම් කැබැල්ලක්

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්ද කෙසෙල්වත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවේ කෙසෙල්වත්ත ග්‍රාම නිලධාරි වසමේ පිහිටි "ගල් වළපල කුඹුර" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. බී. අබේසිංහ විසින් 2004 ජූනි මස 5 වැනි දින සටහන ප්‍රකාර 2003 ජූනි මස 13 වැනි දින මැන සකස් කරන ලද අංක. 850 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක. 1D දරන ඉඩම කැබැල්ල.

ප්‍රසිද්ධ නොතාරිස් අයි. ජී. ඒ. සුමේධනී විසින් සහතික කරන ලද්දාවූ ද, DFCC Bank PLC (Successor to DFCC Vardhanan Bank PLC.) නමට ලියන ලද්දාවූද 2018 ජූනි මස 12 වැනි දින සහතික කරන ලද අංක. 4789 දරන බැඳුම්කරයන් මත අයවිය යුතු මුදල ගෙවීමට Keselwatta Distributors (Private) Limited ණයකරු/උකස්කරු වශයෙන් පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත සඳහන් දේපළ **2023 ක් වූ ජනවාරි මස 20 වැනි දින පෙ.ව. 11.30 ට** දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2019.09.06 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද, 2019.08.21 වැනි දින "දිවයින" දි ''අයිලන්ඩ්'' සහ 2019.08.23 "තිනකුරල්" යන පුවත් පත් බලන්න.

*දේපළට ප්‍රවිෂ්ට වන මාර්ගය.*- කොළඹ සිට ගාළු ප්‍රධාන මාර්ගය ඔස්සේ (පරණ ගාළු පාර) මොරොන්තුඩුව පාලම සහ කෙසෙල්වත්ත නගරය පසුකර කිමී. 23 කණුව දක්වා ගමන් කර වමට හැරී දිග්ගල පාරේ මීටර් 300 ක් පමණ ඉහත කී කිමී කණුවට පෙර දිග්ගල පාරේ මීටර් 150 ක් පමණ ගමන් කර අවසානයේ වමට හැරී ආරක්ෂිත දේපළවටල ගමන් කළ හැකි අඩි 30 ක් පළලැති පාරේ ගමන් කිරීමෙන් මෙම දේපළට ළඟාවිය හැකිය.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මුදලින් 10%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද , (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් සහ ඒ මත අයවිය යුතු බද්ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500 ක් ද, (6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු ද වේ. ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, ඩබ්ලිව් ඒ ඩී රාමනායක මාවතේ, අංක 73, ඩීඑෆ්සීසි බැන්ක් හි ණය සම්බන්ධීකරණ කළමනාකාරිනී, ණය පුනරුත්ථාපන සහ අයකිරීම් ගෙන් විමසන්න. දුරකතන අංක 011-2371371.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

134 බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකතන අංක : 2873656, 0777 672082, 0777449452
ෆැක්ස් : 2871184

12-365

---

**ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී**
**(ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අනුපාප්තික)**

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියයි

**පානදුර කෙසෙල්වත්තේ පිහිටි රූඩ් 01 යි පර්චස් 36.70 විශාලැති අගනා බිම් කැබැල්ලක්**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්දේ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවේ කෙසෙල්වත්ත ග්‍රාම නිලධාරි වසමේ පිහිටි "මාරගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. බී. අබේසිංහ විසින් 2003 ජුනි මස 13 වැනි දින මැන සකස් කරන ලද අංක. 849 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක. D දරන ඉඩම කැබැල්ල.

ප්‍රසිද්ධ නොතාරිස් අයි. ජී. ඒ. සුමේධනී විසින් සහතික කරන ලද්දාවූ ද DFCC Bank PLC (Successor to DFCC Vardhanan Bank PLC.) නමට ලියන ලද්දාවූද 2018 ජුනි මස 12 වැනි දින සහතික කරන ලද අංක. 4787 දරන බැඳුම්කරයන් මත් අයවිය යුතු මුදල ගෙවීමට Keselwatta Distributors (Private) Limited ණයකරු/උකස්කරු වශයෙන් පැහැර හැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත සඳහන් දේපළ **2023 ක් වූ ජනවාරි මස 20 වැනි දින පෙ.ව. 11.45 ට** දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*වැඩිදුර විස්තර සඳහා* .- 2019.09.06 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද, 2019.08.21 වැනි දින "දිවයින" ''දි අයිලන්ඩ්'' සහ 2019.08.23 "තිනක්කුරල්" යන පුවත් පත් බලන්න.

*දේපළට ප්‍රවිෂ්ට වන මාර්ගය*.- කොළඹ සිට පරණ ගාළු පාර ඔස්සේ කෙසෙල්වත්ත මංසන්ධියේ කි. මී. 22 1/2 කණුව දක්වා ගමන් කර එතැන් පටන් වමට හැරී දිග්ගල තොටුපල පාරේ කි. මී. 1 1/2 ක් පමණ ගමන් වමට හැරී පිඹුරේ දැක්වෙන පරිදි ගමන් කිරීමෙන් මෙම දේපළට ළඟාවිය හැකිය.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මුදලින් 10%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද , (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් සහ ඒ මත අයවිය යුතු බද්ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500 ක් ද, (6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු ද වේ. ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, ඩබ්ලිව් ඒ ඩී රාමනායක මාවතේ, අංක 73, ඩීඑෆ්සීසි බැන්ක් හි ණය සම්බන්ධීකරණ කළමනාකාරිනී, ණය පුනරුත්ථාපන සහ අයකිරීම් ගෙන් විමසන්න. දුරකතන අංක 011-2371371.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

134 බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකතන අංක : 011 - 2873656, 0777 672082, 0777449452
ෆැක්ස් : 2871184

12-366

**නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ හිඟුරක්ගොඩ - අංක 69 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හිඟුරක්ගොඩ හතමුන හි පරිශ්‍රයන්ට යාකොට, සවිකොට හෝ ගබඩා කොට හෝ ඒවායේ තබා ඇති හෝ ඒවාට අදාළ හෝ/මිලට ගනු ලබන සවිකිරීම් වැද්දුම් සහ සියලුම සහ එක් එක් යන්ත්‍රසූත්‍ර උපකරණ ද වේ.

**යන්ත්‍රසූත්‍ර උපකරණ සහ වෙනත් වත්කම්**

| *S/No* | *Description/Condition Manufacture* | *Machine Make and Model Serial No. Year of* | *Number of Unit* |
|---|---|---|---|
| 01 | 24x16x30 Paddy Stocking Tank | N/A | 02 |
| 02 | 10x10x16 Rice Stocking Tank | N/A | 02 |
| 03 | 12x12x30 Husk Stocking Tank | N/A | 01 |
| 04 | 20 Feet Elevators | N/A | 12 |
| 05 | 26 Feet Elevators | N/A | 01 |
| 06 | Dust Shipterdust Line with Cycloners platform for Machines | N/A | 01 |
| 07 | 52 Feet Elevator (12 Tons per hour) | | 01 |
| 08 | 38 Feet Elevator (12 Tons per hour) | | 02 |
| 09 | Cyclones with assossories | N/A | 02 |
| 10 | 50 Tons Paddy Stocking Tanks | N/A | 02 |
| 11 | Vibro Paddy Stoner | N/A | 02 |
| 12 | Vibro Paddy Cleaner TRL 2125 | N/A | 01 |
| 13 | Rice Huller MLGT 36 | N/A | 02 |
| 14 | Rice Whitener | N/A | 02 |
| 15 | Vibro Rice Grader MMLZ 125 | --- | 01 |
| 16 | MPGM Silky Polisher | | 01 |
| 17 | Air Locker provision of Bulk Supply argumentation Supply of Cables Machine Room writing with Panel Board | N/A | 02 |
| 18 | 6400KG Paddy Stocking Tanks | N/A | 04 |
| 19 | Paddy Building Corns Platform for Tank and Roof | N/A | 04 |
| 20 | 45 Feet Elevator | N/A | 01 |
| 21 | 3T-2 Pass Boiler | N/A | 01 |
| 22 | MPGN 19x Silky Polisher | N/A | 01 |
| 23 | Vibro Paddy Cleaner-China | --- | 01 |
| 24 | PEM Motor 3 MP | | 12 |
| 25 | Gear Motor | N/A | 03 |
| 26 | Air Locker China | N/A | 01 |

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) නමින් පොළොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් යූ. ජී. එච්. ප්‍රග්නවර්ධන මිය යන අය විසින් ලියා සහතික කරන ලද 2016.07.27 දාතම හා උකස් බැඳුම්කරය අංක 1118 සහ උකස් බැඳුම්කර අංක 1120 දරන උකස් බැඳුම්කර දෙක මගින් සහ 2017.05.22 දාතම හා උකස් බැඳුම්කර අංක 1251 සහ 1253 උකස් බැඳුම්කර දෙක යන සියල්ල මත ලබාදුන් ණය මුදල් ආපසු ගෙවීම හිඟුරක්ගොඩ ප්‍රධාන ස්ථානය සහිතව සහ 1992 නොවැම්බර් මස 25 දාතම හා බස්නාහිර පළාත් සභා යටතේ සහතික අංක NCP/HG/DS/13/128 යන සහතිකය යටතේ පළාත් සභා ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් වෙත නිසිලෙස ලියාපදිංචි කොට ඇති "සම්පත් වී ඇඹරුම්හල" යන ව්‍යාපාරික ව්‍යාපාර නාමය යටතේ කරගෙන යන ව්‍යාපාරයේ එකම අයිතිකරු වන හිඟුරක්ගොඩ පදිංචි විතාන හරිස්චන්ද්‍රලාගේ ප්‍රේමසිරි (ණයගැණුම්කරු 1) සහ විතාන හරිස්චන්ද්‍රලාගේ සම්පත් ප්‍රියංග (ණය ගැණුම්කරු 2) යන අය පැහැර හැර ඇති හෙයින් ද, එකී උකස් බැඳුම්කර අංක 1120 සහ 1253 අංක යටතේ බැංකුව වෙත ඉහත විස්තර සඳහන් චංචල (ණය ගැණුම්කරු1) උකස් කොට ඇති හෙයින් ද, නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, ඉහත සඳහන් උකස් කරන ලද චංචල දේපළ - **2023 ක් වූ ජනවාරි මස 26 වැනි දින ප.ව. 02.30 ට** අදාළ දේපල පිහිටි ස්ථානයේදී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම* - හිඟුරක්ගොඩ නගරයේ සිට හතමුන පාරේ කිලෝමීටර් 3 ක් පැමිණි විට මෙම දේපල එම පාරේ වම් පසට වන්නට පාරට මුහුණලා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය:* විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුය.

(1) ගැණුම් මිලෙන් සියයට සියයි 100%,
(2) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(3) ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
(4) ලිපිකරු හා සෝෂක වේතනය රු. 2500/-

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් Covid 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිලධාරින්ගෙන් විමසන්න :

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ තක්සේරුකරුවෝ සහ
උසාවි කොමසාරිස්වරු,

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය
බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ
වාණිජ බැංකු අංක 200, 2 වන මහළ, හල්ස්ඩ්‍රෝෆ් වීදිය,
කොළඹ 12.
දුරකතන අංක : 0112396520.

කළමණාකරු මධ්‍යගත (අයකිරීම් අංශය),
නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී.
අංක 40, නවම් මාවත, කොළඹ 02.
දුරකතන අංක : 011-2448448.

12-427

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - කොහුවල ශාඛාව (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

(1) අතුරුගිරිය ඔරුවල පිහිටි මිලේනියම් සිටි කලාප 2, 4 වන පටුමග වරිපනම් අංක 23 දරන ස්ථානයේ පිහිටි පර්චස් හත (පර්. 7) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි ආදී සියලුම දේ.

(2) කොල්ලුපිටිය ගාලු පාරේ, වරිපනම් අංක 89 - 15/9 දරන ''ද මොනාක් ඇට් ක්‍රෙස්ට් කැට් සිටි'' හි 15 මහලේ පිහිටි වර්ග මීටර් අනූ දෙකක් (ව. මී. 92.0) ක් වූ සුපිරි සහාධිපත්‍ය දේපළ.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ජී. එන්. එස්. සිල්වා විසින් සියල්ල ලියා සහතික කරන ලද අංක ලද අංක 450 හා 2014.06.06 දින දරන උකස් බැඳුම්කරය සහ අංක 1064 හා 2017.02.01 දින දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රාජකරුණා මෝටර් ට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් හා හේරත් මුදියන්සේලාගේ රවින්ද චතුරංග ශ්‍රී රාජකරුණා උකස්කරු වශයෙන් විසින් පැහැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල වලට අනුව, එකී බැඳුම්කර යටතේ අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම මුදල් අයකර ගැනීම සඳහා මෙහි පහත සඳහන් උපලේඛනයන්හි දක්වෙන දේපළ

**පළමුවන උපලේඛනයේ සඳහන් දේපළ, වර්ෂ 2023 ජනවාරි මස 09 වැනි දින පෙරවරු 10.00 ට එකී දේපළ, පිහිටි ස්ථානයේ දී ද,**

**දෙවන උපලේඛනයේ සඳහන් දේපළ, වර්ෂ 2022 ජනවාරි මස 09 වැනි දින පෙරවරු 11.30 ට එකී දේපළ, පිහිටි ස්ථානයේ දී ද මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.**

**පළමුවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කඩුවෙල මහනගර සභා සීමාවේ අතුරුගිරිය දිස්ත්‍රික් කාර්යාලය තුළ ශාන්තාලෝකගම (ග්‍රා. නි. කොට්ඨාස අංක 487ඒ) ග්‍රාම නිලධාරී වසම තුල ඔරුවල ගමේ පිහිටි මිලේනියම් සිටි කලාප 2, 4 වන පටුමග වරිපනම් අංක 23 දරන වනපොතුමූකලාන, ඔරුවලවත්ත, දෙනගහදෙනිය සහ මහකැලේමූකලාන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. පී. ආර්. පතිරාජ විසින් සාදන ලද අංක 2535 සහ 1999.06.22 වැනි දින දරන පිඹුරේ ලොට් 379 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : ලොට් 380 ද, නැගෙනහිරට : අංක ලොට් 391 බී ද, දකුණට : ලොට් 378 සහ බස්නාහිරට : ලොට් 365 ද මායිම් වූ එකී අංක 2535 දරන පිඹුර ප්‍රකාරව පර්චස් හත (අ. 0, රූ. 0, පර්. 7) ක විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි සහ එහි ඇති සෑම සියලු දේ ත් වේ.

**දෙවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මහනගර සභා සීමාව තුළ ගාලු මුවදොර ග්‍රාමනිලධාරී වසම තුළ කොල්ලුපිටිය පාර ඔබ්බෙහි (කොල්ලුපිටිය කොට්ඨාස අංක 37 හි ගාළු පාරේ) පිහිටි සහ වරිපනම් අංක 8915/9 දරන ''ද මොනාක් ඇට් ක්‍රෙස්කැට් සිටි'' නමැති ඉඩමේ පිහිටි සහ බලයලත් මිනින්දෝරු ජී. බී. දොඩන්වල විසින් සාදන ලද අංක 6562 සහ 2008 පෙබරවාරි මස 26 දින දරන සහාධිපත්‍ය පිඹුරේ අංක වයි/එෆ්15/යූ 5 දරන (පහළොස්වන මහලේ) නේවාසික සහාධිපත්‍ය ඒකකයට මායිම් වශයෙන් උතුරට : මෙම ඒකකයේ බිත්තිය ද, නැගෙනහිරට : මෙම ඒකකයේ බිත්ති සහ සීඊ එෆ්2/15 සහ වයි/එෆ්15/11 ද, දකුණට : සීඊ එෆ් 15/11, සීඊඑෆ් 15/10 දරන ඒකකය සහ වයි/එෆ්14/යූ 4 දරන ඒකකය ද, බස්නාහිරට : වයි/එෆ්15/යූ 4 සහ වයි/එෆ්5/යූ 4 දරන ඒකකය (ඉහලට මුහුණලා) සහ මෙම ඒකකයේ බිත්තියද, මුදුනට : වයි/එෆ්16/යූ 4 දරන ඒකකය සහ පහළට : වයි/එෆ්14/යූ5 දරන ඒකකයද මායිම් වූ එකී අංක 6562 දරන සහාධිපත්‍යය පිඹුර ප්‍රකාරව වර්ග මීටර් අනූ දෙකක් (ව.මී. 92) විශාලත්වයෙන් යුත් බිම් ප්‍රමාණය වේ. මෙම ඒකකයට අයත් සහාධිපත්‍ය දේපළේ පොදු උපාංගවල නොබෙදූ කොටස් වටිනාකම 23%වේ. මෙම ඒකකයට ක්ෂණික පොදු ප්‍රවේශය සීඊ එෆ්15/10 වේ.

මේ සමග වන :

ඒ 152 අනුබැඳි ඒකකය (රථගාල) (අනුබැඳි ඒකකය) පහත සඳහන් පරිදි මායිම් වේ:-

උතුරට : වයි/බී/එෆ් 0, එෆ්1/යූ 1/ඒ5 ඒකකයද, නැගෙනහිරට : ඒ 151 ඒකකයද, දකුණට : සීඊ එෆ්0/1 ද, බස්නාහිරට : සීඊ එෆ් 0/1 ද, මුදුනට : මෙම ඒකකයේ ඉහළ මුහුණත, පහළට : මෙම ඒකකයේ කොන්ක්‍රීට් පොළව ද, මායම් වූ එකී අංක 6562 දරන සහාධිපත්‍ය පිඹුර ප්‍රකාරව වර්ග මීටර් දොලහක් (ව.මී. 12) විශාලත්වයෙන් යුත් බිම් ප්‍රමාණය සහ අංක 450 දරන උකස් බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති පොදු උපාංග සමග වේ.

*අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා*.- 2021.02.19 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2021.03.01 වැනි දින ඩේලි මිරර්, මව්බිම සහ තිනකුරල් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.-*

*පළමුවන උපලේඛනයේ සඳහන් දේපළට පිවිසීම.* - අතුරුගිරිය නගරයේ සිට කි. මී. 1.3 ක පමණ ඉදිරියට ගොස් මිලේනියම් සිටි නිවාස සංකීර්ණයට ප්‍රවේශ විය හැකි වටරවුමට ළඟා වී MDH ජයවර්ධන මාවතට පිවිස මීටර් 250ක් පමණ ගිය විට ඔබට 4 වන පටුමගෙහි පිහිටි වරිපනම් අංක 23 දරන විෂය දේපළ වෙත ළඟා විය හැක.

*දෙවන උපලේඛනයේ සඳහන දේපළට පිවිසීම.* - කොළඹ පිටකොටුව සිට ගාළු පාර දිගේ ගෝල්ෆේස් දක්වා ගමන් කරන්න. ගෝල්ෆේස් හි මීටර් 200ක් පමණ ඉදිරියට යන විට ඔබට සිනමන් ග්‍රෑන්ඩ් තරු 5 හෝටලයට ළඟා විය හැක. වරිපනම් අංක 89-15/9 මොනාක් ඇට් ක්‍රෙස්කැට් සිටි ලෙස හැඳින්වෙන සිනමන් ග්‍රෑන්ඩ් තරු 5 හෝටල් පරිශ්‍රයේ පිහිටා ඇති අතර විෂය සභාධිපත්‍ය දේපළ 15 වන මහලේ (නේවාසික සභාධිපත්‍ය පාර්සලය Y/F15/U5 ලෙස ලකුණු කර ඇති පහළොස්වන මහලේ) පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් පාලන අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු ද, 3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු ද, 4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය ද, 5. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව ලෙස රු. 2,000 ක් ද, 6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000 ක් ද වේ.

තවද, ගැණුම් මිලෙන් සියයට අනූවක් (90%) ක් වූ ඉතිරි මුදල විකිණීමේ දින සිට දින තිහක් (30) ඇතුළත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතු වේ. තවද දින තිහක් (30) ඇතුළත ඉතිරි මුදල නොගෙව්වහොත් ගෙවා ඇති සියයට දහය (10%) ක් මුදල අහිමි කිරීමට සහ එකී දේපළ නැවත විකිණීම ට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. බැංකුවට අයිතිය ඇත.

*හිමිකම් ඔප්පු හා වැඩි විස්තර සඳහා.* - ජ්‍යෙෂ්ඨ කළමනාකාර - වාණිජ අයකිරීම්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී., අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 12.

දුරකතන අංක : 011 - 2661833, 011- 2661836, 011- 2661826.

කේ. පී. එන්. සිල්වා (සා. වි.)
ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු, තක්සේරුකරු
හා උසාවි කොමසාරිස්.

අංක 109/12ඒ, ගෝතමී පාර,
බොරැල්ල, කොළඹ 08
දුරකතන අංක : 011- 4329335, 077 - 8441812.

12-441